// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2425/22 – 2025 පෙබරවාරි මස 25 වැනි අඟහරුවාදා – 2025.02.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය IR/COM/03/2020/83

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.03.07 දිනැති හා අංක 2270/3 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.02.28 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අවිස්සාවේල්ල, කුඩගම පාර, අංක 165 හි පදිංචි ටී. ඒ. එන්. පියසේන මහතා සහ කොළඹ 02, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 1826 හි පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/12/2022 හා 2025.01.31 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්.කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025පෙබරවාරි මස 18 වැනි දින.
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.

1A – G 043834 – 18 (2025/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ - බේරුම්කරණය හා කාර්මික අධිකරණ ශාඛාව

ටී. ඒ. එන්. පියසේන මයා,
අංක 165, කුඩගම පාර,
අවිස්සාවේල්ල.

නඩු අංක A/12/2022
IR/COM/03/2020/83

පළමු පාර්ශ්වය

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය.
අංක 1826,
විත්තම්පලම් ඒ ගාඩිනර් මාවත.
කොළඹ 02.

දෙවන පාර්ශ්වය

ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරාවුල

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යවරයා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමඟින් කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2022.02.28 වැනි දින බේරුම්කරු වශයෙන් කුමාරි ජයරත්න වන මා පත් කර ඇත.

මෙම කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු පහත සඳහන් පරිදි ප්‍රකාශයට පත් කර ඇත.

“ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවය කළ ටී. ඒ. එන්. පියසේන මයාට උසස්වීම් හා වැඩ බැලීම් දීමනා හිමි ද? යන්නත්, හිමි නම් ලැබිය යුතු සහනයන් කුමක්ද? කුමන කාලයක් සඳහාද? යන්නත් පිළිබඳව වේ. ”

**පසුබිම් තොරතුරු හා නිරීක්ෂණ**

පළමු පාර්ශ්වය 1985.12.02 දින දෙවන පාර්ශ්වීය අධිකාරියට viii වන ශ්‍රේණියේ පොත් තැබීමේ ලිපිකරුවෙකු ලෙස සේවයට බැඳී ඇත. අනතුරුව 1992.05.05 දින සිට vii ශ්‍රේණියේ පොත් තැබීමේ ලිපිකරු තනතුරට උසස්වීමක් ලබා ඇති බව. ඉක්බිතිව 1998.10.01 දින සිට vii (ඒ) ශ්‍රේණියේ ගිණුම් සහකාර තනතුරට උසස්වීමක් ලබා ඇති බව. පසුව 2012.01.24 දින vi ශ්‍රේණියේ සහකාර ගණකාධිකාරි තනතුරට උසස්වීමක් ලබා ඇති බව. 2012.03.19 දින සිට 2017.01.31 දින ලිපියෙන් පෙරදාතම් කර ලබා දී ඇත. JM 1-1ii ගිණුම් නිලධාරි ii ශ්‍රේණියට උසස්වීම් ලබා ඇත.

අනතුරුව 2019.02.05 දින පළමු පාර්ශ්වය විශ්‍රාම ලබා ඇත. පළමු පාර්ශ්වය vi ශ්‍රේණියේ සහකාර ගණකාධිකාරි තනතුරේ සේවය කරමින් සිටියදී 2012 පෙබරවාරි 15 දිනැති ලිපියෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) ගේ අත්සනින් යුතුව රාජකාරි පැවරීම යන ශීර්ෂය යටතේ ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි තනතුරෙහි රාජකාරි පළමු පාර්ශ්වයට පවරා ඇත.

ඉහත කී රාජකාරී පැවරීම සම්බන්ධයෙන් දිගින් දිගටම සාක්ෂි දෙපාර්ශ්වයම විසින් ම මතුකර ප්‍රශ්න පිළිතුරු ලබා ගෙන ඇත. පළමු පාර්ශ්වයේ සාක්ෂි මඟින් සෑම අවස්ථාවකදීම කියා සිටියේ JM 1-1 ii ශ්‍රේණියේ ගිණුම් නිලධාරි නිත්‍ය තනතුරේ සිටියදී එම තනතුරට තනතුරු දෙකක් ඉහලින් පැවති ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි තනතුරේ රාජකාරි පැවරීමක් සිදු කර එම ඉහළ තනතුරේ රාජකාරි තමා විසින් 2012.02.15 සිට විශ්‍රාම යන 2019.02.05 දක්වා ඉටු කල බවයි. ඒ සඳහා එම තනතුරේ රාජකාරි පැවරීම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) විසින් සිදු කර ඇති බවත්, මෙම රාජකාරි පැවරීම ලිඛිතව නිසි පරිදි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) සිදු කර එම ලේඛන ද දෙපාර්ශ්වයම පිළිගනිමින් R7, R8, A9, A10 ලෙස ගොනු කර ඇත. එහිදී එම ලිපිවල පිටපත් ආයතනය තුල ඒ පිළිබඳ දැනුවත් විය යුතු හා පියවර ගත යුතු නම් ඒ සඳහා අදාළ නිලධාරින් 5 දෙනෙකු දැනුවත් කොට ඇත. (R7, R8 ලේඛනවල සඳහන් වේ.) එමෙන්ම එම රාජකාරි පැවරීම තුල සාවද්‍යභාවයක් හෝ පළමු පාර්ශ්වය එම රාජකාරි ඉටු කිරිම පිළිබඳව කිසිම විරෝධතාවයක් 2012.02.15 සිට

2019.02.05 දක්වා ම පැන නැඟී නැත. පළමු පාර්ශවය විසින් එම ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි තනතුරට හිමි පැවරු රාජකාරි සම්බන්ධ කිසිදු අවස්ථාවක වැරදි සිදුවීමක්, අනර්ථයක් සිදු වූ බවක් හෝ පැහැර හැරීමක්, නොහැකියාවක් සම්බන්ධව වාර්තා වූ බවක් දෙවන පාර්ශ්වය තුලින් ඉදිරිපත් නොවීය.

පළමු පාර්ශ්වය තමාගේ නිත්‍ය තනතුරට වඩා තනතුරු දෙකක් ඉහලින් ඇති තනතුරක රාජකාරි ඉටු කිරීම සම්බන්ධව 2015 දී ඊට යම් ගෙවීමක් ලබා දෙන ලෙස තමාට රාජකාරි පැවරූ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) මඟින් ඉල්ලීම් කල බැව් කියා සිටි. එම ඉල්ලීම් සඳහා ප්‍රතිචාරයක් නොලැබුණු බවත් අධිකාරියේ සභාපතිතුමාගේ උපදෙස් පරිදි අභියාචනා කමිටුව වෙත ඉල්ලීම් කල බැව් පළමු පාර්ශ්වය කියා සිටී. එහිදී අවසානයේ ඒ 7 ලේඛනය පරිදි අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදි අංක 17 සඳහන් ප්‍රස්තුත කාරණය වන රාජකාරි ඉටු කිරීම සම්බන්ධ විධිමත් ලිපියක් ලබා දීම අධ්‍යනාය කිරිම සඳහා කළමනාකරණ කමිටුව වෙත යොමු කිරීමට තීරණය කර ඇත. එහිදී පළමු පාර්ශ්වයේ ස්ථාවරය හා සනාථ කිරීම වූයේ ඉහත කී කළමනාකරණ කමිටුව වෙත යොමු කිරීමක් සිදු නොවූ බවයි. (විශ්‍රාම යන තෙක්) නමුත් A7 ලේඛනයේ අංක 17 හි සඳහන් iii නිර්දේශය පරිදි අභ්‍යන්තර උසස්වීම් සඳහා කැඳවා ඇති බැවින් එකී නිලධාරීන් රාජකාරි පවරා ඉටු කළ දින සිට තනතුරට අදාළ සුදුසුකමක් ලැබූ සේ සලකා සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව ලබා දෙන ලෙසටය. එහිදී එපරිද්දෙන්ම ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි තනතුර සඳහා පළමු පාර්ශ්වයට අවස්ථාව ලබා දී ඇත. ඒ බැව් සාක්ෂි මඟින් සනාථ වී ඇත. ඒ වන විට මෙම තනතුර සඳහා ක්‍රියාත්මක වී තිබියේ 2005 බඳවා ගැනීමේ පටිපාටියයි. එහිදී සාක්ෂි ලබා දීමේදී තමාට එම තනතුරට අදාලව සපුරාලිය යුතු සුදුසුකම් සම්පූර්ණ වී නොතිබි බැව් පළමු පාර්ශ්වය පිලිගෙන ඇත. නමුත් පළමු පාර්ශ්වයේ මතය හා තර්කය වූයේ තමාට එම තනතුරේ රාජකාරි ඉටු කිරීමට ලබා දුන්නා නම් එම තනතුරට එය සුදුසුකමක් සේ සැලකිය යුතු බවයි. නමුත් එපමණකින්ම තනතුර ලබා දිය යුතුද? යන්න සාක්ෂි විමසීම් ප්‍රශ්නයේදී පළමු පාර්ශ්වය විසින් කියා සිටියේ ද රාජකාරි කළ පමනින්ම තනතුරේ ස්ථිර කිරීම සම්බන්ධව සඳහනක් හෝ නියමයක් නොමැති බවයි.

තවද විසඳිය යුතු ප්‍රශ්නය තුලින්ම පැන නගින්නා වූ උසස්වීම් ලැබීමක් උපකල්පනය කර එම තනතුර ලැබුනා නම් යැයි සලකා එයට හිමි වැටුප් පියවර මත M-M-1-1 (ii) හිඟ වැටුප් ගණනයද ලබා දෙන ලෙසට පළමු පාර්ශ්වයේ මූලික දිවුරුම් ප්‍රකාශයෙන් හා අවසන් සැලකිරීමෙන් ඉල්ලුම් කර ඇත.

තවද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ක්‍රියාත්මක කිරීමේදී මතු වූ ගැටළු වලට තීරණයක් ලැබී තිබුණේ 2021.01.04 දිනැති සේවක අභියාචනා කමිටුව මඟිනි. එහිදී අධිකාරියේ සේවකයින්ගේ ශ්‍රේණිගත කිරීම් / උසස්වීම් ලබා දීමේදී සිදුව තිබූ යම් යම් ගැටළු සඳහා තීරණ ලබා දී ඇත. එහිදී එය 2015.01.08 සිට 2019.12.01 දක්වා උසස්වීම් පටිපාටියේ සිදුව ඇති අසාධාරණයන්ට පිලියමක් වශයෙනි. නමුත් මෙම නිර්දේශ ක්‍රියාත්මක කල 2021 ජනවාරි 01 වන විට සේවයේ යෙදී සිටි අයට පමනක් අදාළ වන සේ ක්‍රියාත්මක කිරීමට තීරණය දී තිබිණි.

## නිගමන

01. පළමු පාර්ශ්වය 1985.12.02 දින දෙවන පාර්ශ්වයේ අධිකාරියේ viii ශ්‍රේණියේ පොත් තැබීමේ ලිපිකරුවකුව ලෙස සේවයට බැඳී 2019.02.05 දින JM - 1- 1 (ii) ගිණුම් නිලධාරි තනතුරේ විශ්‍රාම ගොස් ඇත. ආයතනික සේවා කාලය වසර 33 ක් පමණ වේ. මේ කාලය තුල උසස්වීම් 4 ක් පමණ පළමු පාර්ශ්වයට ලැබී ඇත. එහිදී ආයතනික ව්‍යුහය පදනම් කොට පළමු පාර්ශ්වයට පමණක් නොව ඔහු හා සමකාලීන හා සමාන්තර ශ්‍රේණි ගත සියළුම අයට එකම ආකාරයට එකම තනතුරුවල රැඳී සිටීමට සිදුව ඇත. එය හුදෙක් පළමු පාර්ශ්වයට පමණක්ම සිදු වූ අසාධාරණයක් නොවේ.

එසේම පළමු පාර්ශ්වයට අභ්‍යන්තර උසස්වීම්වලදී සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව ලබා දී ඇත. එහිදී පළමු පාර්ශ්වය ගණකාධිකාරි M-M-1-1-2 තනතුර සඳහා සම්මුඛ පරීක්ෂනයට යොමු කොට ඇත. එහිදි 2010 බඳවා ගැනීමේ පරිපාටිය භාවිතා කර ඇති අතර එහිදි අදාල සුදුසුකම් අභ්‍යන්තර ඉල්ලුම්කරුවකු ලෙසටද සම්පූර්ණ නොවීම හේතුවෙන් තනතුර ලබා දීමට පදනමක් ඇති වී නොමැති බවයි.

02. දිගින් දිගටම ප්‍රශ්නාවලියක්ම අදාළ කර ගනිමින් පවත්නා “ පළමු පාර්ශ්වයට ලබා දී ඇති රාජකාරි පැවරීමේ ලිපි සම්බන්ධව සාක්ෂි මඟින් හා ලේඛන වලින් හෙලිවන කරුණු පහතවේ ”

පළමු පාර්ශ්වය විසින් තමාගේ තනතුරට තනතුරු දෙකක් ඉහලින් ඇති ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි තනතුරේ රාජකාරි සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) ගේ අත්සනින් යුතු (R7, R8 ලේඛන) ලිපි මඟින් රාජකාරියේ යෙදී ඇත. එහිදී පැහැදිලිව රාජකාරි 12ක් නාමික වශයෙන්ම සඳහන් කොට ඇත. එසේම එම R7, R8 ලේඛනවල පිටපත් ආයතනයේ අදාළ වන සේවා ස්ථානවල ප්‍රධානීන් වෙත යොමු කර ඇත. මෙහිදී දෙවන පාර්ශ්වය විසින් දිගින් දිගටම සාක්ෂි මෙහෙයවමින් හා ආයතන සංග්‍රහයේ සහ කාර්ය පටිපාටික රීතීන් ඉදිරිපත් කරමින් සනාථ කිරීමට උත්සහ කළේ පළමු පාර්ශ්වයට කළ රාජකාරි පැවරීම වැඩ බැලීමක් / රාජකාරි ඉටු කිරීමක්

ලෙසට භාර ගත නොහැකි බවත් එම නිසා ඊට කිසියම් ම ගෙවීමක් හිමි නොවන බවත්ය. එසේ වුවද පළමු පාර්ශ්වය 2012.02.15 සිට 2019.02.05 විශ්‍රාම යන තෙක්ම තමාගේ නිත්‍ය තනතුරට තනතුරු දෙකක් ඉහලට තිබූ ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි තනතුරේ රාජකාරී සිදු කර ඇත. ඒ කාලය තුල පළමු පාර්ශ්වය විසින් කළ රාජකාරිවල වැරැද්දක්, අඩුපාඩුවක් හෝ මොනයම්ම ආකාරයට පැහැර හැරීමක් පිළිබඳව වාර්තා වී ඇති බවට හෙළි නොවේ. එසේම ඒ කාලය ගත හොත් වසර 7ක් යනු සාධාරණ සේවා කාලයක් ලෙසට මැනිය හැකි අතර තනතුරට හිමි සුදුසුකම් නොමැතිව වුවද පළපුරුද්ද හා සේවා ලැදියාව මත කළ සේවය ඇගයීම දෙවන පාර්ශ්විය අධිකාරියෙන් ඉටු වී නොමැති බැව් පෙනේ. එසේම ආයතනික අවශ්‍යතා මත අවශ්‍ය අවස්ථාවල ආයතන සංග්‍රහයත් කාර්ය පටිපාටික රීතින් අනුගමනය කරන අතර අනෙකුත් අවස්ථාවල අධ්‍යක්ෂක මණ්ඩල තීන්දු තීරණ මත රැඳී පවතිමින් කටයුතු කරනු ලබයි. මේ තත්ත්වය හුදෙක්ම අර්ධ රාජ්‍ය ආයතනවල දක්නට ලැබෙන සාධාරණ නොවන කරුණක් සේ දකිමි.

## ප්‍රදානය

01. ආරාවුලේ එක් ගැටළුවක් වූ පළමු පාර්ශ්වයට හිමි උසස්වීම් ලබා නොදීම සම්බන්ධව, පළමු පාර්ශ්වය බලාපොරොත්තු වූ ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි තනතුර සඳහා තනතුරට හිමි සුදුසුකම් ඔහු විසින් උපයා ගෙන නොමැති වීම හේතු කොට ගෙන එම තනතුර ඔහුට හිමි විය යුතු නොවන බවට තීරණය කරමි. ඊට පෙර ඔහු විසින් උසස්වීම් නිසි පරිදි උපයා ගෙන ඇති බවත් කලින් කලට සිදු වූ චක්‍රලේඛ හා තීන්දු තීරණවල යම් යම් ගැටළු සහගත තත්ත්වයන් තිබුනද ඒවාට තීන්දු තීරණ මේ අවස්ථාවේ ලබා දීම සාධාරණ හා යුක්ති සහගත නොවන බවත්, ආයතනයේ සේවා කාලය සේවා පළපුරුද්ද හා තනතුරක රාජකාරි කළ පමණින්ම තනතුරකට හිමිකම් කීම හා තනතුරක් ස්ථිරව ලබා දීම සාධාරණ නොවන බවට ද තීන්දු කරමි.

02. පළමු පාර්ශ්වය විසින් ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි තනතුරේ රාජකාරි ඉටු කිරීම සිදු කර ඇත්තේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) ගේ අනුදැනුම හා ලිඛිත අවසරය මත හෙයින් එම රාජකාරි ඉටු කිරීම අනෙකුත් අදාළ අංශයන් දැනුවත් කර තිබීම මත ඒ සඳහා නිසි පත්වීමක් ලබා දීම හෝ පාරිශ්‍රමිකයක් ගෙවීම දෙවන පාර්ශ්වයේ වගකීමකි. එම වගකීම දෙවන පාර්ශ්වය පැහැර හැර ඇත.

03. එමෙන්ම ඒ පිළිබඳව ආයතනයෙන් විමසීම හා තමාට හිමිනම් ඒ අයිතිවාසිකම් පිළිබඳව ඉල්ලීම පළමු පාර්ශ්වයේ ද වගකීමකි. නමුත් එවන් ඉල්ලීමක් සිදු කර ඒ පිළිබඳව අභියාචනා කමිටු තීන්දුවක් ලබා දී ඇත්තේ 2016.10.28 දින ය. ඒ අනුව ආයතනය විසින් තම නිත්‍ය තනතුරට අමතර ව ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි තනතුරෙහි වැඩ බැලීම/ ආවරණය කළා සේ සලකා ලබා දී ඇති හිඟ ගණනයන් මෙසේය.

2012.02.16 දින සිට 2016.10.28 දින දක්වා = 250045.43

2016.10.29 දින සිට 2019.02.04 දින දක්වා = 177594.26

මෙහිදී අභියාචන කමිටු තීන්දුවෙන් පසු කාලය එනම්

1. 2016.10.29 සිට 2019.02.04 දක්වා කාලයට ලැබිය යුතු රු. 177594.26 ක් හා

II. 2012.02.16 සිට අභියාචනා කමිටු තීන්දුව ලද 2016.10.29 දක්වා කාලයට හිමි ගණනය කිරිමෙන් එනම් රු 250045.43 ක මුදලින් 1/4ක ප්‍රමාණයක් වන රු.62511.35 ක මුදලකුත් (එසේ 1/4 ලබා දීමට සාධාරණ හා යුක්ති සහගත යැයි සලකනුයේ පළමු පාර්ශ්වය ඉල්ලීමක් නොකළද, එම රාජකාරි ඉටු කිරීම හා ආයතනයේ වගකීමක් තිබුනද එය පැහැර හැර ඇති නිසාත් බැවිනි) පළමු පාර්ශ්වයට ලබාදීම සාධාරණ බැව් තීරණය කරමි.

04. විසඳීමට ඉදිරිපත් වූ කාරණයට පරිබාහිරව පරීක්ෂන අවස්ථාවේ මතු වූ හා පළමු පාර්ශ්වය විසින් ඉල්ලීම් කළ වැටුප් පියවරයන්හි නිසි පරිදි අන්තර්ග්‍රහණය නොකිරීම් හා 2021.01.04 සේවක අභියාචනා කමිටු තීන්දු පරිදි කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ක්‍රියාත්මක විමේදී 2015.01.18 සිට 2019.12.01 දක්වා උසස්වීම් පරිපාටියේදී සේවකයින්ට සිදු වී තිබූ අසාධාරණයන්ට සහන ලබාදීමේදී පළවන පාර්ශ්වයද එම අගතියට පත් කාණ්ඩයට අදාල බවත් එනමුත් විශ්‍රම ගොස් සිටි නිසා එම වරප්‍රසාද නොලැබී ඇති බවත්. ඉහත කී එම වරප්‍රසාද හා නිවැරදි වැටුප් පියවරයේ හා උසස්වීම් ලැබීම සඳහා මාවිසින් ලබා දී ඇති ඉහත ප්‍රදානයන් එම කරුණු සඳහා මොනයම්ම ආකාරයකට හෝ අදාල නොවන බවත්ය.

හිඟ දීමනා රු.240,105.61( රු දෙලක්ෂ හතලිස් දහස් එකසිය පහයි සත හැට එක ) මෙම නියෝගය ගැසට් පත්‍රයේ පළවීමෙන් මාසයක් ඇතුලත දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත පළමු පාර්ශ්වයට ලබා ගැනීමට හැකි වන පරිදි තැන්පත් කළ යුතු වේ.

ඉහත කී ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත බැව් තීරණය කරමි.

**කුමාරි ජයරත්න,**
බේරුම්කරු.

2025 ජනවාරි මස 31 වැනි දින දී ය.

EOG 02 - 0243

---

මාගේ අංකය - IR/COM/05/2018/125

## කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.03.22 දිනැති හා අංක 2115/50 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.03.14 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 10, ආනන්ද රාජකරුණා මාවත, අංක 141 හි පිහිටි නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය (සේවකයින් තිදෙනෙක් වෙනුවෙන්) සහ අනෙක් පාර්ශ්වය වශයෙන් හබරාදූව, කොග්ගල, ආයෝජන ප්‍රවර්ධන කලාපය හි පිහිටි යුනිවෙලා (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 31/2019 හා 2024.12.20 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්.කේ.කේ.ඒ. ජයසුන්දර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 පෙබරවාරි මස 20 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය -IR/COM/05/2018/125

### කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදිය

නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය,
අංක 141,
ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10.
(සේවකයින් තිදෙනෙක් වෙනුවෙන්) *පළමු පාර්ශ්වය*

නඩු අංකයA/31/2019 සහ

යුනිවෙලා (ප්‍රයිවට්) ලිමිටඩ්,
ආයෝජන ප්‍රවර්ධන කලාපය,
කොග්ගල,
හබරාදූව. *දෙවන පාර්ශ්වය*

### ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය අනුව ඔහු වෙත පැවරී ඇති බලතල අනුව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2019.03.14 දිනැති නියෝගයෙන් බේරුම්කරුවකු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

### ආරාවුලට හේතු වී ඇති කාරණය

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ:

> “ යුනිවෙලා ප්‍රයිවට් ලිමිටඩ් සමාගමේ සේවය කළ සේවකයින් වන එල්. දිනේෂ් නුවන් කුමාර ලම්බියස්, බී. ඒ. ඩී. යුරේෂ් හසංක රූපසිංහ සහ ලක්ෂාන් ගුණසේකර යන තිදෙනාගේ සේවය සේවයෝජක සමාගම විසින් එම සේවකයින් සේවය අත්හැර ගියා සේ සළකමින් අවසන් කිරීම නිසා අසාධාරණයක් සිදු වී තිබේද? යන්න සහ එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන් එකිනෙකාට හිමි විය යුතු සහන මොනවාද ?” යන්න පිළිබඳ ව වේ.

### පෙනී සිටීම

යුනිවෙලා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සේවය කරමින් සිටි එල්. දිනේෂ් නුවන් කුමාර ලම්බියස් බී. ඒ. ඩී. යුරේෂ් හසංක රූපසිංහ සහ ලක්ෂාන් ගුණසේකර යන සේවකයින්ට සහනයන් පතමින් මෙම නඩුවේ පළමුවැනි පාර්ශ්වය ලෙස නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය විසින් කර ඇති පැමිණිල්ලක් අනුව මෙම බේරුම්කරණ නඩු නිමිත්ත උපචිත වී ඇත. සහනය පතන එල් දිනේෂ් නුවන් කුමාර, බී. ඒ. ඩී. යුරේෂ් හසංක රූපසිංහ සහ ලක්ෂාන් ගුණසේකර යන තිදෙනාත්, නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමයේ සංවිධායක එස්. යූ. ලියනාරච්චි මහතාත් 2021.12.07 දින හැර බේරුම්කරණ විභාගයන් පැවති සෑම අවස්ථාවකට ම පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් සහභාගී වූහ. ආරම්භයේ දී පළමු වැනි පාර්ශ්වය වෙනුවෙන් මූලික ප්‍රකාශය සහ දෙවැනි ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ පටන් බේරුම්කරණ විභාගය අවසන් වන දින තෙක් පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටියේ නීතිඥ ටී. ලීලානන්ද මහතාය.

දෙවැනි පාර්ශ්වයේ ආයතනය වෙනුවෙන් යුනිවෙලා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ මානව සම්පත් කළමනාකාරිණී ඉෂාණි සමරසේකර රාජපක්ෂ මහත්මිය, සමූහ නීති නිලධාරිනී එරංදි චන්ද්‍රතිලක මහත්මිය, සහකාර මානව සම්පත් කළමනාකරු ඉරාන් කුලරත්න මහතා, සහකාර මානව සම්පත් කළමනාකරු මාධව ගමගේ මහතා, සහකාර මානව සම්පත් කළමනාකරු හිරාන් කුලරත්න මහතා, මානව සම්පත් විධායක ශාඛ්‍යා බණ්ඩාර මහතා, මනව සම්පත් කළමනාකරු ප්‍රභාත් දිසානායක මහතා, මානව සම්පත් විධායක ජනනී ගම්මන්පිල මහත්මිය, ජෝෂ්ඨ මානව සම්පත් විධායක රුමේෂා පරණගම මහත්මිය, මානව සම්පත් සාමාන්‍යාධිකාරී අජිත් කුමාර සියඹලාපිටිය මහතා, මානව සම්පත් විධායක චතුර මධුශාන් මහතා දෙවැනි පාර්ශ්වයේ ආයතනය වෙනුවෙන් යම් යම් දිනවල දී වරින් වර බේරුම්කරණ විභාගයට සහභාගී වූහ. දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් බේරුම්කරණ විභාගයේ ආරම්භක දිනයේ දී නීතිඥ සරත් කරුණාරත්න මහතා පෙනී සිටි අතර 2019.12.02 දින සිට බේරුම්කරණ විභාගය අවසන් වන තෙක් නීතිඥ විකුම් ජයලත් මහතා සමග නීතිඥ කේ.ජී. ජිනදාස මහතා දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටියේ ය.

### බේරුම් කරණ විභාග පටිපාටිය

මෙම බේරුම්කරණ විභාගය 2019.10.30 වැනි දින පළමු වතාවට කැඳවනු ලැබුණි. දෙපාර්ශ්වය විසින් ගොනු කරන ලද පළමු සහ දෙවැනි ප්‍රකාශයන් පාර්ශ්වයන් දෙකට ම හුවමාරු කර භාර දෙනු ලැබ. ඒවා ද සැලකිල්ලට ගෙන විභාගයකට අවතීර්ණ නොවී දෙපාර්ශ්වයේ එකඟතාව මත කිසියම් සාධාරණ සමථයකට එළඹිය හැකි ද යන්න පිළිබඳ දැඩි උත්සාහයක් ගන්නා ලදී. එබඳු සමථයකට දෙපාර්ශ්වය ගෙන ඒම අපහසු වූයෙන් විභාගය ඇරඹුණි. බේරුම්කරණ විභාගය 2019.10.30, 2019.12.02, 2020.01.09, 2020.07.01, 2020.08.12, 2020.09.29, 2021.01.05, 2021.02.24, 2021.12.07, 2021.12.23, 2022.02.24, 2022.03.30 සහ 2022.04.21 යන දිනයන් 13කට කැඳවා විභාගය පවත්වන ලදී. දින නියම කරන ලද නමුත් 2020.03.24, 2020.10.23, 2021.01 22 සහ 2021.03.29 යන දිනයන්හි දී පරීක්ෂණ විභාගය නොපැවැත්විණි.

සාක්ෂි විභාගය ආරම්භයේ දීම දෙවැනි පාර්ශ්වයේ නීතිඥවරු තම පළමුවැනි ප්‍රකාශයේ සඳහන් කර ඇති මූලික විරෝධතා සැළකිල්ලට ගෙන මෙම යොමුව නිශ්ප්‍රභා කරන ලෙස ඉල්ලා සිටියහ. ඒ පිළිබඳ ව දෙපාර්ශ්වයේම නීතිඥවරුන් දක්වන ලද අදහස් වලින් පසු ව, එකී මූලික විරෝධතාවන්ට අගතියක් නොවන ආකාරයෙන් සාක්ෂි විභාගය ඉදිරියට ගෙන යන ලෙස දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා ඉල්ලා සිටියේ ය. (2019.12.02 දින කාර්ය සටහන් පිටු අංක 2) මෙම බේරුම්කරණ විභාගයේ දී හබයකින් තොර ව පළමුවැනි පාර්ශ්වය සාක්ෂි විභාගය පළමුවෙන් ආරම්භ කළ අතර, එම පාර්ශ්වය වෙනුවෙන් සහනය පතන සේවකයින් වන එල්. දිනේෂ් නුවන් කුමාර (ලම්බියස්), බී. ඒ. ඩී. යුරේෂ් හසංක රූපසිංහ සහ ලක්ෂාන් ගුණසේකර යන අයගේ සාක්ෂිය විභාග කෙරුණි. ඉන් පසුව පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් මෙම කාර්මික ආරාවුලට විෂය වූ වෘත්තීය සමිති ශාඛාවක් පිහිටුවනු ලැබූ අවස්ථාව වන විට එහි මව් සංගමය වන නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමයේ ලේකම් ලෙස කටයුතු කළ වරාහේන ලියනගේ දොන් ඇන්ටන් මාකස් මහතා දිවුරුම් පෙත්සමක් මගින් ගොනු කරන ලද මූලික සාක්ෂිය මෙහෙයවනු ලැබුණි. පළමුවැනි පාර්ශ්වයේ නඩුව අවසන් කිරීමෙන් පසුව දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් ආයතනයේ සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) අජිත් කුමාර සියඹලාපිටිය මහතාගේත්, ආයතනයේ මානව සම්පත් කළමනාකාර ඉෂානි සමරසේකර රාජපක්ෂ මහත්මියගේත් දිවුරුම් පෙත්සම් මගින් ඉදිරිපත් වූ සාක්ෂි මෙහෙයවනු ලැබුණි. දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් තවදුරටත් ආයතනයේ කාර්ය අධ්‍යයන අංශයේ සහකාර කළමනාකරු රුවන් නිශ්ශංක අත්තනායක මහතාගේත්, කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය ස්වස්ථතා අංශයේ විශේෂඥ වෛද්‍යවරයෙකු ලෙස සේවය කරන වෛද්‍ය වජිර පලිපාන මහතාගේත් වාචික සාක්ෂි මෙහෙයවනු ලැබුණි. පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් PI සිට P16 දක්වා ලේඛනත්, දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් R1 සිට R10 දක්වා ලේඛනත් ලකුණු කොට ඉදිරිපත් කෙරුණි.

මෙම බේරුම්කරණ විභාගයට විෂය කාරණය වන්නේ, පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන් වන දිනේෂ් නුවන් කුමාර, යුරේෂ් හසංක හා ලක්ෂාන් ගුණසේකර යන සේවකයින් තිදෙනාගේ සේවය දෙවැනි පාර්ශ්වයේ සේවායෝජක විසින් අවසන් කරනු ලැබීමය.

එකී සේවකයින් තිදෙනා හබරාදූව, කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ ස්ථාපිත කර ඇති යුනිවෙලා ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ සේවයට බැඳී ඇත්තේ පහත සඳහන් දිනවල දීය.

| | | | |
|---|---|---|---|
| 1. | දිනේෂ් නුවන් කුමාර | - | 2012.05.02 |
| 2. | බී. ඒ. ඩී. යුරේෂ් හසංක | - | 2012.01.15 |
| 3. | ලක්ෂාන් ගුණසේකර | - | 2013.12.01 |

මෙහි යොමුවට අනුව බේරුම්කරණයේ කාර්යභාරය වන්නේ මොවුන් තිදෙනා සේවය අතහැර ගියේ ය යන පදනම මත ඔවුන්ගේ සේවය සේවායෝජක විසින් අවසන් කිරීම යුක්ති සහගත ද යන්න නිශ්චය කිරීම සහ එසේ වී ඇති නම් ඔවුන්ට දිය යුතු සහනයන් මොනවා ද යන්න නිගමනය කොට ප්‍රදානයක් පිරිනැමීමයි.

**පළමුවැනි පාර්ශ්වයේ ස්ථාවරය**

මෙහි සහනය පතන සේවකයින් තිදෙනා තම සහෝදර සේවක පිරිස් ඒකරාශී කොට ස්වකීය අයිතියක් ලෙස වෘත්තීය සමිතියක් ආරම්භ කිරීම එම සේවය අවසන් කිරීමට හේතුව වූ බව පළමුවැනි පාර්ශ්වයේ මූලික ස්ථාවරයයි.

බේරුම්කරණයෙන් එකී සේවකයින් තිදෙනා ඇතුළු තවත් සේවක පිරිසක් නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවක සංගමය නැමැති වෘත්තීය සමිතියේ ශාඛාවක් පිහිටුවීම සඳහා ආයතන පරිශ්‍රය තුළ 2018.06.10 වන දින රැස්වීමක් පවත්වා ඇත. ඒ අනුව එකී වෘත්තිය සමිති ශාඛාවේ මව් සංගමය වන්නේ නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවක සංගමයයි. මෙම බේරුම්කරණ විභාගයට අදාල පැමිණිල්ල ඉදිරිපත් කර ඇත්තේ ද, එම නිසා මෙම යොමුවට අදාල පළමුවැනි පාර්ශ්වය වන්නේ ද එකී වෘත්තීය සමිතියයි.

එකී වෘත්තීය සමිති ශාඛාව පිහිටුවා ගත් බව ඊට පසු දින ම, එනම් 2018.06.11 වන දින ආයතනයේ කළමණාකාරීත්වයට නිල වශයෙන් දැනුම් දුන් බව පරීක්ෂණයේ දී P1 ලෙස ලකුණු කළ ලේඛනයෙන් පළමුවැනි පාර්ශ්වය සනාථ කරයි. වෘත්තීය සමිති ශාඛාව පිහිටු වූ බව ගාල්ල සහකාර කම්කරු කොමසාරිස්වරයාටත්, ආයෝජන මණ්ඩලයේ කලාප අධ්‍යක්ෂකවරයාටත් එදින ම දැනුම් දී ඇත. කළමනාකාරීත්වය දැනුවත් කරන ලද එම ලිපියේ මෙහි සහනය පතන දිනේෂ් නුවන් කුමාර තැනැත්තා වෘත්තීය සමිති ශාඛාවේ සම සංවිධායක ලෙසත්, යුරේෂ් හසංක ( බී. ඒ. යුරේෂ් වසන්ත නමින්) සහ ලක්ෂාන් ගුණසේකර යන දෙදෙනා විධායක කමිටු සාමාජිකයින් ලෙසත් පත් වුණි.

එම ආරම්භක රැස්වීමට මව් සංගමයේ සම ලේකම් ඇන්ටන් මාකස් මහතා ද සහභාගි විය.

2019.12.02 දිනැති පරීක්ෂණ කාර්ය සටහන්වල 9 සහ 10 පිටුවල සාක්ෂි දෙමින් දිනේෂ් කුමාර යන අය මෙසේ කියා ඇත.

"ප්‍ර : මේ ලේඛනය අත්සන් කර තිබෙන්නේ කවුද?
උ : ඇන්ටන් මාකස් මහතා,
ප්‍ර : ඔහු එය අත්සන් කර තිබෙන්නේ, සම ලේකම් හැටියටද?
උ : ඔව්.
ප්‍ර : මේ ලේඛනයේ පිටපත් කාටද යොමු කර තිබෙන්නේ, සහකාර කම්කරු කොමසාරිස් (කාර්මික සම්බන්ධතා) වෙත යොමු කර තිබෙනවාද?
උ : ඔව්.
ප්‍ර : සහකාර කොමසාරිස් (ගාල්ල) යොමු කර තිබෙනවාද ?
උ : ඔව්.
ප්‍ර : කලාප අධ්‍යක්ෂක ආයෝජන මණ්ඩලය වෙත යොමු කර තිබෙනවාද?
උ : ඔව්."

ඒ අනුව සහනය පතන සේවකයින් තිදෙනා සහ තවත් පිරිසක් සමඟ විධිමත් ලෙස වෘත්තීය සමිතියක් පිහිටුවා ගත් බව පළමුවැනි පාර්ශ්වය තහවුරු කරයි. එකී වෘත්තීය සමිති ශාඛාව පිහිටුවීමෙන් පසු ව ආයතනයේ කළමනාකාරිත්වය ඊට ප්‍රතිරෝධී ප්‍රතිචාරයන් දක්වන්නට පටන් ගත්හ. වෘත්තීය සමිතිය නවත්වා දමන ලෙස පාලන අධිකාරිය ශාඛා වෘත්තීය සමිතියේ සංවිධායකයින්ට බලපෑම් කරන්නට විය. 2019.02.02 දිනැති බේරුම්කරණ සාක්ෂි සටහන් පිටු අංක 10 සිට 11 පිටුවල මෙසේ සාක්ෂි දී ඇත.

"ප්‍ර : මේ P1 ලේඛනය මගින් තමුන්ලා මේ වෘත්තීය සමිති ශාඛාවක් පිහිටෙව්වාට පසුව මොකක්ද මුහුණ දුන්න අත්දැකීම?
උ : අපට වෘත්තීය සමිතිය නවත්වන ලෙස ආයතනයෙන් බලපෑම් කරනු ලැබුවා.
ප්‍ර : කවදාද ? කව්රුන් විසින්ද බලපෑම් කළේ?
උ : සමූහ මානව සම්පත් කළමනාකාර අජිත් සියඹලාපිටිය මහතා.
ප්‍ර : ඒ මහතා අද මෙතන ඉන්නවාද?
උ : නැහැ.
ප්‍ර : වෙන කව්ද?
උ : ඒ අවස්ථාවේදී රැඳී සිටියේ එතුමා පමණයි.
ප්‍ර : ඊට පසුව මොකද වුණේ?
උ : අපි රැස්වීම් පවත්වන ස්ථානයට කැඳවා මා ඇතුළු පිරිසට කිව්වා යුනියන් එක පවත්වාගෙන ගියොත් ආයතනය වහන්න වෙනවා. ඒක නිසා මේක නවත්වන්න කියලා.
ප්‍ර : කවද්ද ඒ කිව්වේ?
උ : 2018 ජුනි මාසයේ දිනය මතක නැහැ."

ආයතනයේ මානව සම්පත් කළමනාකරු සියඹලාපිටිය මහතා මෙන් ම, ආයතනයේ වෙනත් ඉහළ නිලධාරීන් විසින් ද මෙම වෘත්තීය සමිතිය පිහිටුවීමේ කටයුතු වලට විරෝධය දක්වනු ලැබූහ. උදාහරණයක් ලෙස අංශ ප්‍රධානි අරුණසිරි මහතා මේ සේවකයින්ට අංශයේ පිටතට යාමට ඉඩ නොදීම ආදි නොයෙකුත් අවහිරතා පමුණුවා ඇත. ඒ කාරණය සාක්ෂි මඟින් තහවුරු කිරීමක් සිදු නොවුණ ද අනෙකුත් පාරිසරික සාධක සමඟ ගැලපීමේ දී වෘත්තීය සමිතිය පිහිටුවීමෙන් පසු සේවක පිරිසට විවිධ අවහිරතාවලට මුහුණ දෙන්නට සිදු වූ බව පළමු වැනි පාර්ශ්වය ස්ථාවරයක් වශයෙන් ගොඩනගා ඇත.

මෙම අවහිරතා පැවතුනත් සහනය පතන ඉල්ලුම්කරුවන් තිදෙනා ඇතුළු වෘත්තීය සමිතිය පිහිටුවීමට මූලිකත්වය ගත් පිරිස නොනවත්වා ම එම සමිතිය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරගෙන ගොස් ඇත. එම කටයුතු අතර අත් පත්‍රිකා බෙදීම, සාමාජිකයින් දැනුවත් කිරීම වැනි කටයුතු කළ නමුත් ඔවුන් කිසිදු කඩාකප්පල්කාරී ක්‍රියාවක නොයෙදුණු බව පළමුවැනි පාර්ශ්වය අවධාරණය කළේ ය.

ඉන්පසුව දිනේෂ් නුවන් කුමාර නැමැති මෙහි සහනය පතන සේවක මහතා 2018.06.25 වන දින වැඩ බිමෙහි ගේට්ටුව ළඟට කැඳවා ගෙනවුත් සේවා ස්ථානයෙන් එළියට දමා ඇත. බේරුම්කරණ විභාගයේ දී 2019.12.02 දින ඔහු සාක්ෂි දෙමින් මෙසේ කියා ඇත.

"ප්‍ර : ඊට පසුව මොකද වුණේ?

උ : 2018 ජුනි මාසේ 25 වන දින 1.45 ට පමණ සේවයට පැමිණියා. මට රැකියාව ආරම්භ කිරීමට තිබුණේ 2.45 ට. 3.10ට විතර මාව පනිවිඩයක් කියන්න කියලා නියෝජ්‍ය මානව සම්පත් කළමනාකාරතුමා වන එවකට හිටපු තරිඳු මහතා මාව කැඳවාගෙන ගියා එළියට.

ප්‍ර : ඒ මහතා අද දින මෙතන ඉන්නවාද?

උ : නැහැ.

ප්‍ර : ඊට පසුව මොකද වුණේ?

උ : ඉන්පසුව ප්‍රධාන ගේට්ටුව ලඟට කැඳවාගෙන ඇවිල්ලා කිව්වා ඉහළින් මට කියලා තිබෙනවා දිනේෂ්ව එළියට දාන්න කියලා, රැකියාවෙන් ඉවත් කරන්න කියලා, ඊට පසුව මම මගේ ඇඟිල්ල සළකුණු කොට ප්‍රධාන ගේට්ටුවෙන් ඉවතට ආවා.

ප්‍ර : ඔබ එහෙම කළේ ඔබේ කැමැත්තෙන්ද ඔබට ලැබුණු නියෝගය අනුවද ?

උ : නියෝගයට අනුව."

ඉන්පසු ව එදින ම ඔහු ආයෝජන මණ්ඩලයට ගොස් එහි ප්‍රධානි ගොඩගේ මහතා හමුවී මේ පිළිබඳව පැමිණිලි කර ඇත. තවද එදින ම හබරාදුව පොලිස් ස්ථානයට ගොස් තම සේවය නතර කිරීම පිළිබඳ ව පැමිණිල්ලක් කොට ඇති අතර එම පැමිණිල්ලේ සහතික කළ පිටපතක් P2 ලෙස මෙහි දී ලකුණු කර ඉදිරිපත් කරන ලදී. මේ පිළිබඳව පොලිස් ස්ථානයේ පරීක්ෂණයක් කරන ලද අතර ආයතනය වෙනුවෙන් මානව සම්පත් කළමණාකාරිනී ඉෂානි රාජපක්ෂ මහත්මිය සහභාගි විය.

2018.06.26 වන දින උදේ 10.00 ට ආයෝජන ප්‍රවර්ධන කලාපය ගොඩනැගිල්ලට පැමිණෙන ලෙස තමා සේවා ස්ථානයෙන් බැහැර කළ ඉරාන් මහතා තමාට දුරකථනයෙන් දැනුම් දුන් අතර, එම කැඳවීමට අනුව තමා එහි ගිය බව දිනේෂ් නුවන් කුමාර යන අය සාක්ෂි දෙමින් කියා සිටියේ ය. තමා ඇතුළු සේවය අහිමි කළ සේවකයින් පිරිස එහි රැස්වීමට සහභාගිවීමට පැමිණ සිට ඇත. එම රැස්වීමට ඉෂානි රාජපක්ෂ මහත්මියත්, ඉරාන් මහතාත් ආයතනය වෙනුවෙන් සහභාගී වී සිටි අතර ඉවත් කළ සේවකයින් කිසිවෙකු කවර ආකාරයකින්වත් සේවයට නැවත බඳවා නොගන්නා බවට ප්‍රකාශ කොට ඇති අතර මුදලක් ලබාගෙන මෙම ප්‍රශ්නය අවසන් කරන ලෙසට දැනුම් දී ඇත. ඒ අනුව මෙහි සහනය පතන සේවක මහතුන් තිදෙනා හැර සේවය අහිමි කරනු ලැබූ සෙසු පිරිස යම් මුදලක් ලබාගෙන හබ කිරීමකින් තොර ව සේවයෙන් ඉවත් වීමට තීරණය කරනු ලැබ ඇත.

ඉන් පසු ව 2018.07.02 දින තම නමට ආයතනයෙන් ලියාපදිංචි තැපැලෙන් එවා තිබුණු ලිපියක් ලැබුණි. එය විවෘත කිරීමේ දී කවරය තුළ කිසිවක් නොතිබුණු අතර එය හුදෙක් හිස් කවරයක් බව දැක ඇත. මෙය යම් කූට උත්සහයක් බව වටහාගත් ඔහු මෙහි සහනය පතන අනෙකුත් සේවකයින් වන යුරේෂ් හසංකටත්, ලක්ෂාන් ගුණසේකරටත් වහාම දුරකථනයෙන් කතා කොට තත්වය පැහැදිලි කර දී ඔවුන්ට ද එවැනි ලිපි ලැබුනහොත් ඒවා විවෘත නොකරන ලෙස දන්වා ඇත. ඒ අනුව ඔවුන් දෙදෙනාට ද ලැබී විවෘත නොකරන ලද ලිපි දෙක බේරුම්කරණ විභාගයේ දී P6 සහ P11 යනුවෙන් ලකුණු කර ඉදිරිපත් කෙරුණි.

පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි දුන් දෙවැනි සාක්ෂිකරු වන මෙහි සහනය පතන ලක්ෂාන් ගුණසේකර යන අයගේත්, ඉන්පසු සාක්ෂි දුන් නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවක සංගමයේ සම ලේකම් ලියනගේ දොන් ඇන්ටන් මාකස් මහතාගේත් සාක්ෂි මඟින් පළමුවැනි පාර්ශ්වයේ එම ස්ථාවරය වැඩිදුරටත් තහවුරු කරනු ලැබිණි.

තම සේවක අයිතිවාසිකම් සුරක්ෂිත කරගැනීම උදෙසා වෘත්තිය සමිතියක් පිහිටුවීමට පියවර ගැනීම හේතුවෙන් සහනය පතන සේවකයින් තිදෙනාගේ සේවය අහිමි කර ඇති බව පළමුවැනි පාර්ශ්වය ගොඩනැගූ ස්ථාවරය විය. ඒ අනුව සහනය පතන සේවකයින්ට නැවත රැකියාව ලබා දෙන ලෙසට පළමුවැනි පාර්ශ්වය අයැද සිටී.

**දෙවැනි පාර්ශ්වයේ ස්ථාවරය**

බේරුම්කරණ විභාගය ආරම්භයේ දී ස්වකීය ප්‍රකාශවලිනුත් සාක්ෂි විභාගයේ හබ කිරීම්වලදිත් දෙවැනි පාර්ශ්වය විසින් මෙම බේරුම්කරණ යොමුව පිළිබඳ ව මූලික විරෝධතා දෙකක් මතු කරනු ලැබිණි.

1. මෙම පැමිණිල්ල කර ඇත්තේ නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවක සංගමය විසින් බවත් සේවය අහිමි කරන ලද්දේ යයි කියන, මෙහි සහනය පතන සේවකයින් තිදෙනා එම සංගමයේ විධිමත් සාමාජිකත්වයක් ලබා ඇති අය නොවන බවත් ඒ නිසා

ඔවුන්ගේ සේවය අහිමි කිරීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට හෝ මෙහි පළමුවැනි පාර්ශ්වය ලෙස ඉදිරිපත් වීමට අදාල වෘත්තීය සමිතියට අයිතියක් නැති බව.

2. බේරුම්කරණයට යොමු කර ඇති මෙම ආරාවුල සුළු ආරාවුලක් නොවන බවත්, සේවකයින්ගේ සේවය අවසන් කිරීම පිළිබඳ ආරාවුලක් බැවින්, කාර්මික ආරාවුල් පනතේ ප්‍රතිපාදන ප්‍රකාර ව මෙබඳු පැමිණිල්ලක් යොමු කළ යුතු වන්නේ කම්කරු විනිශ්චය සභාවකට බවත්, එබැවින් මෙම යොමුව දෝශ සහිත නිසා විභාගයට නොගෙන ම නිෂ්ප්‍රභා කළ යුතු බව.

පළමුවැනි මූලික විරෝධතාව කහවුරු කිරීමට අදාල සේවකයින් තිදෙනා ඉහත කී වෘත්තීය සමිතියේ විධිමත් සාමාජිකත්වය ලබාගෙන නැති බවත්, ඊට සාමාජික මුදල් ගෙවා නැති බවත් හුවා දක්වමින් ඒ නිසා ඔවුන් වෙනුවෙන් ඉල්ලීමක් කිරීමට අදාල වෘත්තීය සමිතියට නෛතික අයිතියක් නොමැති බව දෙවැනි පාර්ශ්වය කියා සිටියේ ය.

2019.12.02 දින කාර්ය සටහන් පිටු අංක 57 හි පළමු වැනි සාක්ෂිකරුගේ සාක්ෂිය විභාග කිරීමේ දී මෙසේ කියා ඇත.

“ප්‍ර : මේ යුනියන් එකට මුදල් ගෙවන්නේ කොහොමද? තමන්ට සාමාජිකත්වයක් තිබෙනවා ද මේ යුනියන් එකේ ?
උ : එහෙමයි
ප්‍ර : සාමාජිකත්ව කාඩ් එකක් තිබෙනවාද?
උ : තියෙනවා.
ප්‍ර : දැන් තිබෙනවාද?
උ : නැහැ. දැන් ගෙනාවේ නැහැ
ප්‍ර : අනිත් දවසේ ගෙනත් දෙන්න පුලුවන්ද?
උ : පුලුවන් ”

2020.01.09 දින කාර්යය සටහන් පිටු අංක 2 හි ඔහු ම සාක්ෂි දෙමින් මෙසේ කියා සිටි.

“ප්‍ර : මාසෙකට කීයක් ගෙවන්න ඕනැද?
උ : 100.00
ප්‍ර : දැන් මාස 18 ක් මුදල් ගෙවා තිබෙනවා ද?
උ : ඔව්.
ප්‍ර : මාස 18 ක මුදල් ගෙවූ බවට රිසි තිබෙනවාද?
උ : නැහැ”

වෘත්තිය සමිතියට සාමාජික මුදල් ගෙවූ බවට බේරුම්කරණ විභාගයේ දී කිසිදු අවස්ථාවක රිසිට පත් කිසිවක් ඉදිරිපත් වුනේ නැත. එසේ වුවත් P9 සහ P10 යනුවෙන් ලකුණු කර ඉදිරිපත් කර ඇති බී. ඒ. ඩී. යුරේෂ් හසංක රූපසිංහ සහ ලක්ෂාන් ගුණසේකර යන දෙදෙනා එකී වෘත්තිය සමිතියේ සාමාජිකත්වය ලබා ගත් ඉල්ලුම්පත්වලින් සනාථ වන බව නිරීක්ෂණය කරමි.

මෙම මූලික විරෝධතා 2 ක් සම්බන්ධයෙන් තම අවසන් සැලකිරීම්වල දී තවදුරටත් කරුණු දැක්වීමට ඇති ඉඩ කඩ රඳවා තබා බේරුම් කරණයේ සාක්ෂි විභාගය පවත්වන ලදී.

සිද්ධිමය වශයෙන් දෙවැනි පාර්ශ්වයේ ස්ථාවරය වූයේ සේවායෝජක ආයතනය විදේශීය පාරිභෝගිකයන් සඳහා ලෝකයේ ප්‍රධාන සන්නාම යටතේ භාණ්ඩ නිෂ්පාදනය කරන ආයතනයක් බවත්, එහි නිෂ්පාදන කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා ලෝකයේ පිළිගත් තාක්ෂණික හා වෙනත් ක්‍රමෝපායන් යොදා ගන්නා බවත්, ඒ උදෙසා ඩාන්සින් මොඩියුල් (Dancing Module) නමැති දියුණු නිෂ්පාදන ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලද බවත් ය.

තවද සේවකයන්ට අත්තනෝමතික ව කටයුතු කිරීමට, අනෙක් සේවකයින්ගේ නිෂ්පාදන කටයුතුවලට බාධා වන අයුරින් කතා කර කර සිටීමට, ඉහළ නිලධාරීන්ගේ නියෝගවලට අවනතනොවීමට වැනි විනය විරෝධී ක්‍රියාවල යෙදීමට අවස්ථාවක් ලබා දීමට මෙම ආයතනයේ නිෂ්පාදන සංස්කෘතිය මගින් ඉඩක් නොසැලසේ. සහනය පතන මෙම සේවකයින්ගෙන් ආයතනයේ නිෂ්පාදන ක්‍රියාවලියට බාධා එල්ල වූ බව දෙවැනි පාර්ශ්වය කියා සිටී.

දෙවැනි පාර්ශ්වය ඉදිරිපත් කළ පළමු ප්‍රකාශයේ නිශ්චිතව කියා සිටි පරිදි ඔවුන් 2018 ජුනි මස 13 සහ 14 වැනි දිනවල කම්හලේ යහ පැවැත්මට බාධා වන පරිදි මෙහි සහනය පතන තිදෙනා ඇතුලු සේවක පිරිසක් කටයුතු කර ඇත. තවද 2018.06.18 වෙනි දින ඔවුන්

තිදෙනාත් තවත් සේවකයන් 29 දෙනෙකුත් සේවා ප්‍රධානීන්ගේ නියෝග නොපිළිපදිමින්, එදිරිවාදී ව හැසිරෙමින්, වැඩබිම තුළ රැස්වීම් පවත්වමින් සහ තම නිෂ්පාදන ඉලක්කයන් සපුරාලීම පැහැර හරිමින් කලහකාරී ව කටයුතු කරන්නට පටන්ගත්හ. ඒ නිසා ආයතනයේ,

අ). කාර්යක්ෂමතාව සහ ගුණාත්මක භාවය පහළ වැටුණි
ආ). 5S විනය බිඳ වැටුණි.
ඇ). වැඩ බිමෙහි කාර්මික සාමයට කැළලක් විය.

ඒ බව ආයතනයේ පාලනාධිකාරිය විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ද දැනුම් දුන් බවත්, අනතුරු ව 2018.06.25 වන දින කොග්ගල ආයෝජන මණ්ඩලයේ කාර්මික සබඳතා පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා, ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධාරි සහ කළමනාකාරීත්වය ද සේවකයින් 32 දෙනෙකුද සහභාගී වූ රැස්වීමක් පවත්වන ලදී. එකී රැස්වීම ආයෝජන මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා විසින් අතරමග නවතා දැමූ බැවින්, ආයතනයේ කළමනාකාරීත්වය විසින් රැස්වීම ඉදිරියට පවත්වාගෙන යාමට ආසන්නයේ පිහිටි හෝටලයකට පැමිණෙන ලෙස එකී සේවකයන්ට ආරාධනා කර ඇත. හෝටලයේ පැවැති එකී රැස්වීමට මෙහි සහනය පතන සේවකයන් තිදෙනා හැර ඉතිරි සේවකයන් 29 දෙනා සහභාගී වූහ. එහි දී කරන ලද කරුණු පැහැදිලි කිරීම් පිළිගෙන එකී සේවකයන් 29 දෙනා වන්දියක් ලබාගෙන සේවයෙන් ඉල්ලා අස්වූහ.

එතැන් සිට සහනය පතන මෙම සේවකයන් තිදෙනා 2018.06.20 වන දිනෙන් පසුව සේවය සඳහා වාර්තා කළේ නැත. 2018.06.30 වන දිනැති ලිපියක් මගින් මෙකී සේවකයන් තිදෙනාට ඔවුන් සේවය හැර ගියා ලෙස සළකන බව දන්වා ලිපියක් යවන ලදී.

ඒ අනුව දෙවැනි පාර්ශ්වයේ මූලික ස්ථාවරය ලෙස ඉදිරිපත් වුනේ සහනය පතන මෙම සේවකයන් තිදෙනාගේ සේවය ආයතනය විසින් අවසන් කරනු ලැබුවා නොව ඔවුන් සේවයට නොපැමිණ සේවය අත්හැර ගිය බවයි.

දෙවැනි පාර්ශ්වය විසින් ගොනු කර ඇති අවසන් ලිඛිත සැළකිරීම් සමාප්ත කරමින් ඔවුන්

- මෙම බේරුම්කරණයේ දී මතු කරන ලද නීතිමය කරුණු සහ සිද්ධිමය කරුණු සැලකිල්ලට ගන්නා ලෙසත්,

- මූලික විරෝධතාවන්ගෙන් ඉදිරිපත් කරන කරුණු සැලකිල්ලට ගන්නා ලෙසත්,

- ඉතා කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලියක් ලෙස ලොවම පිළිගත් ඩාන්සින් මොඩියුල් ක්‍රමය භාවිත කරන සේවකයන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ආයතනය ඉතා හොඳින් පහසුකම් සළසන බවත්, එබඳු වූ ආයතනයක් වන දෙවැනි පාර්ශ්වයේ ආයතනයට පදනම් විරහිත චෝදනා නගා ඇති බව සැලකිල්ලට ගන්නා ලෙසත්,

- සේවකයින්ගේ නොපැමිණීම එහි එදිනෙදා නිෂ්පාදන ක්‍රියාවලියට සෘජුව බලපෑම් එල්ල කරන බැවින් ප්‍රශ්නගත සේවකයින් සේවය අත්හැර යන ලද බව සැළකිල්ලට ගන්නා ලෙසත්,

අයැද ඇත.

## නිගමන

- දෙවැනි පාර්ශ්වයේ සේවායෝජක ආයතනය කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපයේ පිහිටි අපනයනය මුල් කර ගත් දිවයිනේ ප්‍රමුඛ ඇඟලුම් නිෂ්පාදන ආයතනයකි. එය විදේශීය පාරිභෝගිකයන් සඳහා ලෝකයේ ප්‍රධාන සන්නාම යටතේ නිෂ්පාදනය කරන ආයතනයකි. එය මෙරට ආර්ථිකයට සෘජුව අපනයන නිෂ්පාදන එකතු කරන මෙන් ම විදේශීය මුදල් උපයන ආයතනයක් ද වේ.

- මෙහි පළමුවැනි පාර්ශ්වයට අදාළ වන සහනය පතන සේවකයන් තිදෙනා දීර්ඝ කාලයක් ආයතනයේ සේවය කරමින් සිටි අය වන අතර ඔවුන් තිදෙනාම සාපේක්ෂව තරුණවියේ පසුවන අය වේ.

- ආයතනයේ නිෂ්පාදන ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කරගැනීමේ අරමුණින් (Dancing Module) නමැති නව නිෂ්පාදන ක්‍රමවේදයක් විශේෂඥ උපදේශ මත ආයතනයේ කළමනාකාරිත්වය විසින් වැඩ බිමේ සේවකයන් සඳහා හඳුන්වා දෙනු ලැබ

ඇත. ඒ හේතුවෙන් සේවකයන්ට දවසේ ඉතා වැඩි කාලයක් හිටගෙන වැඩ කිරීමට සිදුවූ බවත්, ඒ නිසා වැඩ බිමේ ඇතිවන සේවා ප්‍රශ්නවලට විසඳුම් ලබාගැනීම සඳහා සේවකයන් ඒකරාශිවීම සඳහා සහ ආයතනයේ සේවකයන්ගේ සේවක අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම සඳහා වෘත්තීය සමිතියක් පිහිටුවා ගැනීමේ අවශ්‍යතාව සේවකයන්ට පැන නැඟී ඇත.

- එකී වෘත්තීය සමිතිය ආරම්භ කිරීමට සේවක පිරිස පියවර ගෙන ඇත්තේ මෙම බේරුම්කරණ යොමුවේ පළමුවන පාර්ශ්වය ලෙස නම් කර ඇති නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමයේ ශාඛා සමිතියක් පිහිටුවීම මගිනි. ඒ අනුව 2018.06.18 වන දින ආයතනය තුල එකී මව් සංගමයේ ලේකම්වරයාගේ සහභාගිත්වය ද ඇතිව සේවක පිරිසක් ඒකරාශීවී එකී වෘත්තීය සමිති ශාඛාව පිහිටුවාගෙන ඇත. මෙම බේරුම්කරණ යොමුවෙන් සහනය පතන සේවකයින් තිදෙනා එම වෘත්තීය සමිති ශාඛාව පිහිටුවීමේ රැස්වීමට සහභාගී වී ඇති අතර, එය පිහිටුවීමේ මූලිකත්වය ගෙන ඇති බව ද නිරීක්ෂණය කරමි. ආරම්භක රැස්වීමේ දී දිනේෂ් නුවන් කුමාර යන අය වෘත්තීය සමිතියේ සම සංවිධායක තනතුරටත්, බී. ඒ. සුරේෂ් වසන්ත සහ එල්. ගුණසේකර යන අය එහි විධායක සභික තනතුරුවලටත් පත්ව ඇත.

- ඉන්පසුව සහනය පතන සේවකයන් තිදෙනා සහ තවත් සේවක පිරිස් තම වෘත්තීය සමිතියේ සාමාජිකත්වය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කර ඇත. දෙපාර්ශ්වය මේ කාරණය දෙයාකාරයෙන් හුවා දැක්වීමට උත්සාහ කර ඇත. සේවක පක්ෂය කියා සිටියේ පත්‍රිකා බෙදීම්, සාකච්ඡා පැවැත්වීම් හැර, තමන් වෙනත් කිසිදු කඩාකප්පල්කාරී ක්‍රියාවක් සිදු නොකළ බවයි. ආයතනය කියා සිටින්නේ වෘත්තීය සමිතිය පිහිටුවීමෙන් පසු සේවකයින් කළමනාකාරිත්වය සමඟ එදිරිවාදී ව කටයුතු කළ බවයි. කෙසේ වුවත් පෙර නොවූ සේවක හඬ ඉස්මතුවීමක් මිස කළමනාකාරිත්වය හුවා දක්වන ආකාරයේ වැඩබිමේ කාර්මික සාමයට බාධාවන ක්‍රියාකාරකම් සිදුවූ බවක් සාක්ෂි මගින් සනාථ වුනේ නැත. ඉතා පැහැදිලි කාරණයක් වන්නේ වෘත්තීය සමිතිය පිහිටුවීම ආයතනයේ කළමනාකාරිත්වය නොසන්සුන්භාවයට පත්කෙරෙන සංසිද්ධියක් වූ බවයි. මෙම වෘත්තීය සමිතිය පිහිටුවීම කළමනාකාරිත්වය විසින් සළකනු ලැබ ඇත්තේ (Dancing Module) වැනි නිෂ්පාදන ක්‍රමෝපායන් හඳුන්වා දී ආයතනයේ නිෂ්පාදන කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමටත්, ආයතනයේ යහපැවැත්මටත් බාධාකාරී වන සහ අවසානයේ කළමනාකාරිත්වයට සේවක පිරිස රිසි සේ හසුරුවා ගත නොහැකි තත්ත්වයට යොමු විය හැකි විනාශකාරී වැඩ පිළිවෙලක් හැටියට ය.

- ඒ අනුව වෘත්තීය සමිතිය කඩාකප්පල් කිරීමට හෝ අහෝසි කිරීම අරමුණු කරගෙන එහි පුරෝගාමීන් ඉවත්කර දමා මුලින් ම ගැටලුව නිරාකරණය කර ගැනීමට කළමනාකාරිත්වය ක්‍රියා කර ඇති බව පැහැදිලි කරුණකි.

- මෙම සේවකයන් තිදෙනා ඉවත් කිරීමට ආයතනය උපායශීලී සටකපට වැයමක් දරා ඇති බව මනාව ඔප්පු වී ඇත. කළමනාකාරිත්වයට සේවයෙන් ඉවත් කිරීමට අවශ්‍ය වූ සේවකයන් 32 දෙනාගෙන් 29 දෙනෙකු ම වැඩි කරදරයකින් තොර ව ම වන්දියක් ලබාගෙන ඉල්ලා අස් වීමට සැලැස්වීමට පාලනාධිකාරිය සමත් වුවත්, මෙහි සහනය පතන සේවකයන් තිදෙනා එම ක්‍රියාමාර්ගයට දැඩි ප්‍රතිරෝධයක් දක්වා තම රැකියා අයිතිය ම ඉල්ලා සිට ඇත.

- එකී සේවකයන් තිදෙනා සේවයට වාර්තා නොකර සේවය අත්හැරගියා ලෙස සනාථ කර පෙන්වීමට කළමනාකාරිත්වය මෙහි දී උත්සහ ගත්තත්, 2018.06.25 වන දින එකී සේවකයින් බලයෙන් ආයතනයෙන් සැබැවින් පිටමන් කර ඇති බවත්, ඔවුන්ට සේවයට වාර්තා කිරීමට අවස්ථාවක් දී නැති බවත් පැහැදිලි විය.

- මෙම බේරුම්කරණ විභාගයේ දී දිවුරුම් පෙත්සමක් මගින් මූලික සාක්ෂියක් දෙන ලද දෙවැනි පාර්ශ්ව ආයතනයේ මානව සම්පත් කළමනාකාරිනි ඉෂානි අමරසේකර රාජපක්ෂ මහත්මියගේ දිවුරුම් පෙත්සමට R8(i), R8(ii) සහ R8(iii) ලෙස සලකුණු කර අමුණා ඇති 2018.06.25 දිනැති ලිපි තුනෙන් කියවෙන්නේ එකී සේවකයන් තිදෙනා 2018.06.21 දින සිට සේවයට වාර්තා කර නොමැති බවත්, 2018.06.29 දිනට පෙර සේවයට වාර්තා නොකළහොත් ඔවුන් සේවය අත්හැර ගියා ලෙස සලකනු ලබන බවත් ය. මෙම ලිපි යවා ඒවාට ප්‍රතිචාර නොදැක්වූ බැවින් ඔවුන් සේවය අත්හැර ගියා සේ සළකන බව ඉන් පසුව 2018.06.30 වන දිනැති ලිපි මගින් සේවකයන්ට දන්වා ඇති බව සනාථ කර පෙන්වීමට දෙවැනි පාර්ශ්වය උත්සාහ ගෙන ඇත.

- මෙම බේරුම්කරණ විභාගයේ දී P3, P6 සහ P11 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද ලිපි කවර තුන මෙහි නිගමනයන්ට එළඹීමේ දී ඉතා වැදගත්කොට සළකමි. මෙහි සහනය පතන සේවකයින් තිදෙනාට R8(i), R8(ii) සහ R8 (iii) ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද ලිපි තුන ලියාපදිංචි තැපැලෙන් යැවීමට එකී ලිපි කවර තුන භාවිත කළ බව පෙන්වීමට කළමනාකාරිත්වය විසින් සැලසුම් සහගතව සහ උපායශීලීව කටයුතු කර ඇති බව පැහැදිලි කරුණකි. අදාළ ලිපි කවර අතුරින් දිනේෂ් කුමාර යන අයට 2018.07.02 දින ලැබුණු P3 කවරය විවෘත කර බැලීමේ දී එය කිසිදු ලේඛනයක් ඇතුලත් නොවූ හිස් කවරයක් බව ඔහුට පෙනී ගොස් ඇත. ඔහු වහාම දුරකථනයෙන් අනෙක් සහෝදර සේවකයින් දෙදෙනාට කතා කොට ඊට සමාන ලිපි

ලැබුණහොත් විවෘත නොකරන ලෙස දැනුම් දී ඇත. ඔහු සැක කළ පරිද්දෙන් ම අනෙක් දෙදෙනාට ද ඒ ආකාරයේ ම ලිපි දෙකක් තැපෑලෙන් ලැබී ඇති නමුත් එකී ලිපි කවර දෙක විවෘත නොකර තබාගෙන ඇත. ඒවා බේරුම්කරණ විභාගයේ දී P6 සහ P11 ලෙස ලකුණුකොට ඉදිරිපත් කරන ලදී. විවෘත බේරුම්කරණ විභාගයට නිල සාක්ෂිකරුවන්වීමට ආරාධනා කරනු ලැබ සහභාගි වූ කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්මික සම්බන්ධතා අංශයේ කම්කරු කොමසාරිස් මනෝජ් ප්‍රියන්ත මහතාත්, කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරි ඒ ආර්. අයි. ධර්මකුමාර මහතාත් පාර්ශ්වකරුවන් සියලු දෙනාත් සහ දෙපාර්ශ්වයේ නීතිඥවරුනුත් ඉදිරියේ එකී ලිපි කවර දෙක විවෘත කරන ලදී. සියලු දෙනා ඉදිරියේ තහවුරු ව සනාථ වුණේ එකී ලිපි කවර දෙක හිස් ලිපි කවර දෙකක් බවයි. ඒ අනුව දිනේෂ් නුවන් කුමාර විසින් තමාට ද ලැබුණේ හිස් කවරයක් බවට ආයතනයට යවන ලද ලිපියද, තමාට ද ලැබුණේ හිස් කවරයක් බවට පරීක්ෂණයේ දී කරන ලද ප්‍රකාශය ද පිළිගනිමි. මේ මගින් ආයතනය උපායශීලී ව උත්සාහ කර ඇත්තේ 2018.06.25 දාතමින් එම සේවකයින් තිදෙනාට සේවයට වාර්තා කිරීම සඳහා අවසාන නිවේදනයක් නිකුත් කළ බවටත්, ඊට ප්‍රතිචාර වශයෙන් ඔවුන් සේවයට වාර්තා නොකළ බැවින් සේවය අත්හැර ගියා ලෙස සලකා ඔවුන්ගේ සේවය අවසන් කිරීමට කටයුතු කළ බවටත් ව්‍යාජ ලෙස ලේඛන පිළියෙල කර ගැනීමක් බවට නිගමනය කරමි.

- වෘත්තිය සමිතියක් පිහිටුවා ගැනීමට, එහි සාමාජිකත්වය ගැනීමට, නිලතලවලට පත්වීමට සහ නිලතල දැරීමට මෙන්ම වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවල නියැළීමට සේවකයින්ට නෛතික අයිතියක් ඇත. ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ද තහවුරු කර ඇති මූලික අයිතිවාසිකමකි. 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතට ගෙන එන ලද 1999 අංක 56 දරන සංශෝධනයෙන් එක් කරන ලද එහි $V_A$ පරිච්ඡේදය ප්‍රකාරව සේවකයින්ට වෘත්තීය සමිතියක කටයුතුවල නියැළීමට ඇති නෛතික අයිතිය සුරක්ෂිත කර ඇත. එම අයිතිය ඍජු ව හෝ වක්‍ර ව සේවායෝජකයෙකු විසින් උල්ලංඝනය කරනු ලැබීම වරදකි.

- මෙම යොමුවට අදාළ ව සහනය පතන සේවකයින් තිදෙනා සහ අනෙකුත් සේවක පිරිස විසින් වෘත්තීය සමිතියක් ආරම්භ කිරීම සහ එහි සාමාජිකත්වය දැරීම සහ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවල නියැළීම බලහත්කාරයෙන් මැඩ පැවැත්වීමට ආයතනය කටයුතු කර ඇති බව සනාථ වේ. ඒ අනුව ඉහත කී සංශෝධිත පරිදි කාර්මික ආරාවුල් පනතේ ප්‍රතිපාදනයන් ආයතනය විසින් උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරමි. ඒ හේතූන් මත මෙහි සහනය පතන සේවකයින් තිදෙනාගේ සේවය අවසන් කිරීම නීති විරෝධී බවට ද අසාධාරණ බවට ද නිගමනය කරන අතර ඒ නිසා ඔවුන්ට අගතියක් සිදු වී ඇති බවට ද නිගමනය කරමි.

- ඉහත කරුණු සළකා බලා දෙවැනි පාර්ශ්වය ඉදිරිපත් කළ මූලික විරෝධනාවන් ප්‍රතික්ෂේප කරමි.

- කෙසේ වුවත් උද්ගත වූ සිද්ධිමය කරුණු ඉතා පරීක්ෂාකාරී ව විශ්ලේෂණය කරන විට මෙම සේවකයින් නැවත සේවයේ පිහිටුවීමේ ඇති ප්‍රායෝගික දුෂ්කරතා සහ ඔවුන් සේවයට නැවත පැමිණියහොත් මුහුණ දීමට සිදුවිය හැකි අනර්ථකාරී ප්‍රතිවිපාක වැනි කාරණා ගැන ද බේරුම්කරණයේ අවධානය යොමු විය.

**ප්‍රදානය**

1. මෙම යොමුව යටතේ සහනය පතන පහත නම් ඇති සේවකයින් තිදෙනා 2018.06.25 දින සිට බලපැවැත්වෙන පරිදි සේවායෝජක ආයතනය විසින් නැවත සේවයේ පිහිටුවිය යුතු ය.

    (i) දිනේෂ් නුවන් කුමාර - සේවා - 9819
    (ii) බී. ඒ. ඩී. යුරේෂ් හසංක - සේවා අංක: 9539
    (iii) ලක්ෂාන් ගුණසේකර - සේවා අංක: 11433

2. ඒ අනුව ඔවුන්ට හිමි විය යුතු 2018.06.25 දින සිට සේවයේ පිහිටුවන දිනය දක්වා කාලයට හිඟ වැටුප් ගණනය කොට ගෙවිය යුතු ය.

**විකල්ප ප්‍රදානයක්**

3. (අ) දෙවන පාර්ශ්වයේ සේවායෝජක ආයතනය සහනය පතන ඉහත කී සේවකයින් තිදෙනා සේවයේ පිහිටුවීමට එකහෙලා ම විරුද්ධ වන්නේ නම්; ඔවුන්ගේ වයස, ඔවුන්ගේ පෙර සේවා කාලය, ඔවුන්ට ඉදිරියට අහිමි වන සේවා කාලය, ඔවුන්ට ගෙවීමට සිදුවන හිඟ වැටුප් ප්‍රමාණය, ඔවුන්ට වෙනත් ජීවනෝපාය මාර්ගයක යෙදීමට පදනමක් සකසාදීම සහ ඔවුන්ට සිදු වූ අගතිය පිරිමැසීම වෙනුවෙන් සාධාරණත්ව මූලධර්ම පදනම් කරගෙන ඉහත නම්

සඳහන් සහනය පතන සේවකයින් තිදෙනාට සම්පූර්ණ සහ අවසානාත්මක ගෙවීමක් වශයෙන් එක් එක් අයෙකුට රුපියල් මිලියනයක් (රු.1,000,000/=) බැගින් වන වන්දියක් ගෙවිය යුතු ය.

එම ගෙවීම් සම්පූර්ණ සහ අවසානාත්මක ගෙවීම් විය යුතු අතර ඊට අමතර වෙනත් කිසිදු වන්දියක් -ආයතනයෙන් ඔවුනට හිමි නොවිය යුතුය.

(ආ) ඊට අමතර ව ඔවුන්ට ව්‍යවස්ථාපිත ව හිමි විය යුතු සියලු ගෙවීම් කළ යුතු ය.

4. ඉහත අංක: 1 සහ 2 හි ඇතුලත් ප්‍රදානයන් මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පළ වීමෙන් එක් මාසයක් ඇතුලත ක්‍රියාත්මක කොට ඒ බව ගාල්ල සහකාර කම්කරු කොමසාරිස්වරයාට දැනුම් දීම, හෝ ඊට විකල්ප වශයෙන් කරන ලද ඉහත අංක 3 (අ) සහ (ආ) දරන ප්‍රදානයන්හි සඳහන් ගෙවීම් ගාල්ල කම්කරු කොමසාරිස්වරයා වෙත මසක් ඇතුළත තැන්පත් කිරීම කළ යුතුය.

5. මෙම ප්‍රදානයට ඇතුලත් සහනයන් අදාළ විය යුත්තේ මෙහි සහනය පතන ඉහත සඳහන් සේවකයින් තිදෙනාට පමණි.

**එස් විරිතමුල්ල,**
බේරුම්කරු.

2024 දෙසැම්බර් මස 20 වැනි දින දී ය.

EOG 02 - 0244

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.